# සාමාන්‍ය ඉතුරුම් ගිණුම්

ප්‍රධාන නීතිරීතිවල සාරාංශය*

| කෙටි විස්තරය | | |
|---|---|---|
| සාමාන්‍ය ඉතුරුම් ගිණුම් - සැලසුමෙහි විශේෂාංග | | වැඩි විස්තර සඳහා |
| යෝග්‍යතාව | • ශ්‍රී ලංකා රුපියල් 35,000 ක හෝ ඕනෑම අනුමත විදේශ ව්‍යවහාර මුදලින් එම වටිනාකමට සමාන මුදලක සමාන බැර/හර ශේෂයක් පවත්වාගෙන යා යුතුය. | • නීතිරීති සහ කොන්දේසි |
| ප්‍රතිලාභ සැකෙවින් | • දිවයින පුරා ඕනෑම Plus ATM යන්ත්‍රයකින් මුදල් ආපසු ගැනීමේ හැකියාව ඇති Visa ඩෙබිට් කාඩ්පත.<br>• පැය 24 පුරා පාරිභෝගික ක්ෂණික ඇමතුම් සේවාව.<br>• සියලු ශාඛාවන් හි දී මුදල් තැන්පත් කිරීමේ / ආපසු ගැනීමේ පහසුකම්.<br>• අන්තර්ජාල බැංකුකරණ සහ දුරකථන බැංකුකරණ පහසුකම් නොමිලේ. | |
| මූල්‍ය | | |
| ශේෂය අඩුවීමේ ගාස්තුව | • සාමාන්‍ය ශේෂය පවත්වාගෙන නොයන්නේ නම්, **රුපියල් 1500 ක ශේෂය අඩුවීමේ මාසික ගාස්තුවක්** අය කෙරෙනු ඇත. | • බැංකුවේ ගාස්තු ලේඛනය |

| කෙටි විස්තරය | | |
|---|---|---|
| අන්තර්නම්‍ය ආයෝජන ගිණුම් (IIA)- සැලසුමේ විශේෂාංග | | වැඩි විස්තර සඳහා |
| යෝග්‍යතාව | IIA ගිණුම් විවෘත කිරීම පහත අයවලුන් විසින් කළ හැකියි:<br>1. ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර පදිංචි විජාතිකයකු විසින්.<br>2. ශ්‍රී ලාංකික සම්භවයකින් යුතු විජාතික, ශ්‍රී ලංකාවෙන් බැහැර පදිංචි අයෙකු.<br>3. ශ්‍රී ලංකාවෙන් බැහැර පදිංචි, ශ්‍රී ලාංකික පුරවැසියකු.<br>4. මරණයට පත් වූ යම් අයෙකුගේ බූදලය සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසි කටයුතු අවසන් වන තෙක්, බලයලත් නියෝජිත සමග IIA ගිණුම පවත්වාගෙන යාමට කටයුතු කළ එකී මරණයට පත් වූ අයගේ බූදලයෙහි අද්මිනිස්ත්‍රාසිකරු හෝ පොල්මඃකරු.<br>5. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට අවසර දෙනු ලබන වෙනත් ඕනෑම පුද්ගලයකු හෝ යම් කාණ්ඩයකට අයත් පුද්ගලයන්. | * නීතිරීති සහ කොන්දේසි |

| | | |
|---|---|---|
| **ප්‍රතිලාභ සැකෙවින්** | • මෙය නියාමන සැලසුමක් බැවින්, කරුණාකර සැලසුමට අදාළ නීතිරීති සහ කොන්දේසි බලන්න. | |
| **මූල්‍ය** | | |
| **ශේෂය අඩුවීමේ ගාස්තුව** | • **ශේෂය අඩුවීමේ ගාස්තු අදාළ නොවේ.** | • බැංකුවේ ගාස්තු ලේඛනය |

| **සාමාන්‍ය ඉතුරුම් ගිණුම්** | | ප්‍රධාන නීතිරීතිවල සාරාංශය* |
|---|---|---|
| **කෙටි විස්තරය** | | |
| **ළමා ඉතුරුම් ගිණුම් - සැලසුමෙහි විශේෂාංග** | | **වැඩි විස්තර සඳහා** |
| **යෝග්‍යතාව** | • දෙමාපියන් / භාරකරුවන් විසින් බාලවයස්කරුවන් (වයස අවුරුදු 18ට අඩු) සඳහා ගිණුම් විවෘත කළ හැකියි.<br>• මූලික තැන්පතුව රුපියල් 3,000/ඇ.ඩො. 300 හෝ අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට සමාන වටිනාකමක මුදලක්.<br>• බාලවයස්කරුට වයස අවුරුදු 18 සපිරෙන තෙක් මුදල් ආපසු ගැනීමට නොහැක. | • නීතිරීති සහ කොන්දේසි |
| **ප්‍රතිලාභ සැකෙවින්** | • 'දැක-බලා ගැනීමට පමණි' ("View only") පහසුකම සහිත ATM කාඩ්පත, වයස අවුරුදු 12 සම්පූර්ණ කිරීමෙන් පසු.<br>• අනුග්‍රාහක පොලී අනුපාතික.<br>• උපන්දින මවිත කිරීම් (Birthday Surprises).<br>• පැය 24 පුරා පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම්.<br>• සියලු ශාඛාවන් හි දී මුදල් තැන්පත් කිරීමේ පහසුකම්.<br>• අන්තර්ජාල බැංකුකරණ සහ දුරකථන බැංකුකරණ පහසුකම් නොමිලේ {'දැක-බලා ගැනීමට පමණි' ("View only") පහසුකම} | |

| මූල්‍ය | | |
|---|---|---|
| **ශේෂය අඩුවීමේ ගාස්තුව** | • **ශේෂය අඩුවීමේ ගාස්තු අදාළ නොවේ.** | • බැංකුවේ ගාස්තු ලේඛනය |

| | | |
|---|---|---|
| මූලික නීතිරීති | | **වැඩි විස්තර සඳහා** |
| **HSBC Mass සඳහා යෝග්‍යතාව** | • විශේෂාංග සහ ප්‍රතිලාභ භුක්ති විඳීම සඳහා යෝග්‍යතා සුදුසුකම් සහ වෙනත් අදාළ නීතිරීති සහ කොන්දේසි ඔබ විසින් සපුරාලිය යුතු වේ. | • සංකලිත ගිණුම් සඳහා වන නීතිරීති සහ කොන්දේසි ('නීතිරීති සහ කොන්දේසි') |
| **යෝග්‍යතාව සුදුසුකම් වෙනස් කිරීම** | • ඇතුළත්වීමේ යෝග්‍යතා සුදුසුකම් කලින් කලට වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතු වන අතර, එවැනි සංශෝධන HSBC පොදු වෙබ් අඩවියෙහි සහ සිය ශාඛාවන් හි වෙනත් පොදු ස්ථානවල ප්‍රදර්ශනය කෙරෙනු ඇත. | |
| **හවුල් ගිණුම්** | • නීතිරීති සහ කොන්දේසි යටතේ අදාළ ගිණුම, සේවා හෝ අන් ආකාරයේ බැඳීම් හා වගකීම් සම්බන්ධයෙන් හවුල් ගිණුම් හිමියන් එකිනෙකා ද සමග හවුල්ව හා වෙන් වෙන් ව ඔබ සියලුදෙනාම බැඳී සිටියි. | |
| **ගාස්තු** | • අදාළ අවස්ථාවන් හි දී කලින් කලට සේවා ගාස්තු, පහසුකම් ගාස්තු හෝ වෙනත් ගාස්තු පනවනු ඇත. ගාස්තු සහ අයකිරීම් "HSBC ගනුදෙනුකරුවන් සඳහා වන බැංකුකරණ ගාස්තු ලේඛනය" හි ප්‍රකාශයට පත් කෙරෙන අතර, HSBC වෙබ් අඩවියෙන් හෝ ශාඛාවන් වෙතින් ලබාගත හැකිය. | |
| **වාර තැන්පතු සහ ඉතුරුම් සැලසුම් සඳහා පොලී අනුපාතිකයන්** | • ඉතුරුම් සහ කාල තැන්පතු ගිණුම් (විදේශ ව්‍යවහාර මුදල්/දේශීය ව්‍යවහාර මුදල්) සඳහා වූ පොලී අනුපාතික පූර්ව දැනුම්දීමකින් තොරව වෙනස්වීමට විෂය වේ. කෙසේ වෙතත්, පවත්නා කාල තැන්පතු මත ගිවිස ගනු ලැබූ පොලී අනුපාතික කල් පිරෙන තෙක් අප විසින් වෙනස් කරනු නොලැබේ. | • පොලී අනුපාතික |

| | | |
|---|---|---|
| **ණය පහසුකම් සහ සියලු වත්කම් සැලසුම් සඳහා පොලී අනුපාතිකයන්** | • සියලු තැන්පතු/ණය සැලසුම් සඳහා වන පොලී අනුපාතිකයන් වෙළඳපොළ පොලී අනුපාතිකයන්ට අනුව බැංකු විසින් තීරණය කරනු ලබන පරිදි කලින් කලට වෙනස්වීම්වලට විෂය වේ. අපගේ පරිශ්‍රයන් හි සහ/හෝ HSBC පොදු වෙබ් අඩවියේ සහ/හෝ ලිපියක් මගින් සහ/හෝ ප්‍රකාශන පණිවුඩයක් මගින් සහ/හෝ වෙනත් සුදුසු ඕනෑම ආකාරයකට ප්‍රදර්ශනය කිරීම මගින් එවැනි පොලී අනුපාතිකයන්ගේ වෙනස්වීම් ඔබට දැනුම් දෙනු ඇත. | |

| **සාමාන්‍ය ඉතුරුම් ගිණුම්** | | ප්‍රධාන නීතිරීතිවල සාරාංශය* |
|---|---|---|
| **කෙටි විස්තරය** | | |
| **මූලික නීතිරීති සහ කොන්දේසි** | | **වැඩි විස්තර සඳහා** |
| **සේවාවන් හෝ ගිණුම් අවසන් කිරීම** | • පූර්ව ලිඛිත දැන්වීමක් මගින් අපගේ සේවාවන් හෝ ඔබේ ගිණුම් ඔබට අවසන් කළ හැකිය.<br>• ඔබ වෙත සපයන අපගේ සේවාවන් සම්පූර්ණයෙන් හෝ එම සේවාවන්ගෙන් ඕනෑම කොටසක් හෝ කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව අත්හිටුවීම හෝ ඔබගේ ගිණුම් හෝ ඕනෑම ගිණුමක් පෙර දැනුම්දීමකින් යුතුව අත්හිටුවීම හෝ අප විසින් සිදු කළ හැක. | • සංකලිත ගිණුම් සඳහා වන නීතිරීති සහ කොන්දේසි ('නීතිරීති සහ කොන්දේසි') |
| **නීතිරීති සහ කොන්දේසි වෙනස් කිරීම** | • නීතිරීති සහ කොන්දේසි කලින් කලට වෙනස් කිරීම සඳහා වූ අයිතිය අප සතු වන අතර, අපගේ පරිශ්‍රයන් හි, HSBC පොදු වෙබ් අඩවියෙහි හෝ අප විසින් සුදුසු යැයි තීරණය කරන ඕනෑම ආකාරයක් මගින් ඒ බව ඔබ වෙත දැනුම් දෙනු ලැබේ. | |
| **වංචා වැළැක්වීම හා මතභේද නිරාකරණය** | • ප්‍රකාශනයෙහි දක්වා ඇති ඔබේ ගනුදෙනු පරීක්ෂා කර, යම් අසාමාන්‍ය ගනුදෙනුවක් වේ නම්, ඔබේ ප්‍රකාශනය ඔබ වෙත ලැබී දින 20ක් ඇතුළත ඒ බව බැංකුවට දැනුම් දීමට කටයුතු කරන බවට සහතික වන්න. | • මතභේද නිරාකරණය |

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සැලසුම | ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සැලසුම (SLDIS) යනු මූල්‍ය ආයතන වල බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම හේතුවෙන් මූල්‍ය ආයතන වල තැන්පතුකරුවන් හට සිදුවන පාඩු සම්බන්ධයෙන් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ මූල්‍ය ආයතන වල තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම පිණිස, ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් ක්‍රියාත්මක කරනු ලබන යාන්ත්‍රණයකි. ද හොංකොං ඇන්ඩ් ෂැංග්හායි බැන්කින් කෝර්පරේෂන් ලිමිටඩ්, ශ්‍රී ලංකා ශාඛාව යනු, SLDIS හි සාමාජික ආයතනයකි. එබැවින්, කලින් කලට CBSL විසින් තීරණය කරනු ඇති සහ SLDIS විසින් දක්වනු ලබන ආවරණය ගණනය කරනු ලබන ක්‍රමවේදයකට අනුව ගණනය කරනු ලබන උපරිම මුදල ශ්‍රීලංරු.1,100,000/-ක් දක්වා වන්දි ගෙවීමක් ඉල්ලුම් තැන්පතුවක්/තැන්පතු, කාල තැන්පතුවක්/ තැන්පතු හෝ ඉතුරුම් තැන්පතුවක්/ තැන්පතු හිමි කරගැනීමට සුදුසුකම් ලබන එක් එක් ගිණුම් හිමියකු වෙත ලැබෙනු ඇත. හවුල් ගිණුම් හිමියෙකු සම්බන්ධයෙන් වනවිට, සුදුසුකම් ලබන එක් එක් හවුල් ගිණුම් හිමියා වෙනම තැන්පතුකරුවකු ලෙසට සලකනු ඇති අතර, කලින් කලට CBSL විසින් තීරණය කරනු ඇති පරිදි උපරිම මුදල රු.1,100,000/-ක් දක්වා වන්දි ගෙවීමක් ඔහු/ඇය වෙත ලැබෙනු ඇත. කලින් කලට යාවත්කාලීන කළ හැකි හෝ සංශෝධනය විය හැකි SLDIS පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර www.cbsl.gov.lk/sri-lanka-deposit-insurance-scheme බලන්න. | • නීතිරීති සහ කොන්දේසි |

**ඔබේ හඬ**

ඔබේ අදහස් අප වෙත දැන්වීමට කැමති නම්, කරුණාකර අප අමතන්න

තැපැල් ලිපිනය: කළමනාකරු, පාරිභෝගික අත්දැකීම් සහ සබඳතා, HSBC, අංක 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 1.

Premier විමසීම් සඳහා

විද්‍යුත් තැපැල්: premiercustomersolutions@hsbc.com.lk

ක්ෂණික ඇමතුම්: +94 114472272

පුද්ගලික බැංකුකරණ විමසීම් සඳහා

විද්‍යුත් තැපැල්: customersolutions@hsbc.com.lk

ක්ෂණික ඇමතුම්: +94 114472200

ක්‍රෙඩිට් කාඩ්පත් පිළිබඳ විමසීම් සඳහා

විද්‍යුත් තැපැල්: creditcards@hsbc.com.lk

ක්ෂණික ඇමතුම්: +94 114472200

වැඩි සහය සඳහා https://www.hsbc.lk/help/ බලන්න.

අප වෙත මතු කරන ඕනෑම කරුණක් ඔබ සම්පූර්ණයෙන් සතුටට පත්වන ආකාරයට විසඳීමට අප කැමති වන අතරම, ඔබට මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයාගේ කාර්යාලය වෙත ලිපියක් ලියා ප්‍රතිකර්මයක් ඉල්ලා සිටිය හැකිය. ඔම්බුඩ්ස්මන්වරයාගේ ඇමතුම් තොරතුරු පහත දැක්වේ.

තැපැල් ලිපිනය: ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයාගේ කාර්යාලය, 143, වජිර පාර, කොළඹ 06.

දුරකථන : +94 112 595 625

ෆැක්ස් : +94 112 595 624

විද්‍යුත් තැපැල : info@financialombudsman.lk

වෙබ් අඩවිය : www.financialombudsman.lk

- ඒකාබද්ධ ගිණුම් වෙත, පූර්ණ ඒකාබද්ධ ගිණුම් පිළිබඳ නීතිරීති සහ කොන්දේසි අදාළ වේ. මෙම වගුවෙහි අඩංගු මූලික සැලසුම් සඳහා වන නීතිරීති වල සාරාංශය, විමසා බැලීම සඳහා පමණක් වන අතර, එමගින් සම්පූර්ණ නීතිරීති සහ කොන්දේසි ප්‍රතිස්ථාපනය වීමක් සිදු නොවේ. යම් අනනුකූලතාවක් වුවහොත්, සම්පූර්ණ නීතිරීති සහ කොන්දේසි බලපැවැත්වේ. වැඩි විස්තර සඳහා https://www.hsbc.lk/terms-and-conditions/ බලන්න.
- මෙකී මූලික නීතිරීති පිළිබඳ සාරාංශය www.hsbc.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකි අතර, බැංකුවේ සියලු කාර්යාල සහ/හෝ ශාඛා කාර්යාලය වෙතින් මුද්‍රිත ආකාරයෙන් ද ලබාගත හැකිය. මෙකී මූලික නීතිරීති පිළිබඳ සාරාංශයෙහි සිංහල සහ දමිළ අනුවාදන වල යම් මතභේදයක් පවතින අවස්ථාවක දී ඉංග්‍රිසි අනුවාදය බලපැවැත්වෙන බවට මම/අප මෙමගින් තහවුරු කර එකඟ වෙමි/වෙමු.

**වැඩි විස්තර සඳහා පහත දැ බලන්න.**

බැංකුකරණ ගාස්තු ලේඛන මගපෙන්වුම: https://www.hsbc.lk/tariffs/

පොලී අනුපාතික: www.hsbc.lk/rates

මතභේද නිරාකරණය: https://www.hsbc.lk/credit-cards/useful-links/#dispute